තාක්ෂණ ආයතනය

මොරටුව විශ්වවිද්‍යාලය



ශ්‍රී ලංකාව

වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

2021

ආයතනයේ පාලක මණ්ඩලය විසින් **22.04.2022** දින පවත්වන ලද එහි **240** වන රැස්වීමේදී මෙම වාර්තාව අනුමත කරන ලදී

01. අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය

සමාලෝචනය 2021 වර්ෂය



මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය (ITUM) යනු ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (NDT) මෙහෙයවීම සම්බන්ධයෙන් පිළිගැනීමට ලක් වූ තාක්ෂණ අධ්‍යාපනික පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ උසස් අධ්‍යාපනික ආයතනයකි.

COVID 19 වසංගතය හේතුවෙන් අභියෝගාත්මක තත්වයක් මධ්‍යයේ වුව ද 2021 වසර සඳහා ආයතනය සිසුන් 2400 ක් සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. මෙම තත්වය 2021 දී අධ්‍යාපන ක්ෂේත්‍රයට සැලකිය යුතු බාධා ඇති කළ අතර එය වඩාත් අවදානමට ලක්විය හැකි සහ තර්ජනාත්මක තත්වයක් බවට පත් විය. මෙවැනි අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් තුල රට වසා තැබීමත් සමඟ වුව ද මාර්ගගත ක්‍රමයට අධ්‍යයන කටයුතු සිදු කරමින් ප්‍රමාදයකින් තොරව සිසුන්ට ඔවුන්ගේ අධ්‍යන කටයුතු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම ආයතනය මඟින් සිදු කරනු ලැබීය. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හා පරිපාලන කාර්ය මණ්ඩලයේ අධීක්ෂණය හා උත්සාහය මේ සඳහා බොහෝ සෙයින් උපකාරී විය.

ආචාර්ය සුජීව ලෙවන්ගමගේ මහතා 2021 ජනවාරි මාසය වන තෙක් නිසි බලධාරිතුමා වශයෙයන් තාක්ෂණ ආයතනයේ කටයුතු කළ අතර, 2021 පෙබරවාරි 15 දින සිට බලපැවැත්වෙන පරිදි, මේජර් ජෙනරාල් (විශ්‍රාමික) එස් කේ තිරුනාවුකරසු මහතා (RSP VSV USP) මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයෙහි අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී. ආයතනය සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුකූලව 2021 වර්ෂය ආරම්භ කරන ලද්දේ සිසුන් කුඩා කණ්ඩායම් වශයෙනි. කෙසේ වෙතත් ආයතනය එසේ ආරම්භ කල ද අප්‍රේල් මාසයේ දී නැවතත් COVID රෝගීන් වැඩිවීම හේතුවෙන් සිසුන් සඳහා විශ්ව විද්‍යාලය වසා දැමීමට කළමනාකාරීත්වයට සිදු වූ අතර ඒ සමඟම මාර්ගගත ක්‍රමයට අධ්‍යයන කටයුතු කිරීම ආරම්භ කරන ලදි. මෙම කාර්යය අභියෝගාත්මක වුවද අධ්‍යන කාර්ය මණ්ඩලයේ අරමුණ වූයේ අධ්‍යන කටයුතු හා වාර අවසාන විභාග ඇතුලු බොහෝ කාර්යයන් මාර්ගගත ක්‍රමයට හෝ සාර්ථකව නිම කිරීමයි. මාර්ගගගත ක්‍රමයට අධ්‍යයන කටයුතු සිදු කිරීමත් සමඟම ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ඉදිරිපත් කරන ලද මාර්ගෝපදේශ වලට අනුව සිසුන් 500 බැඟින් වන කුඩා කණ්ඩායම් ලෙස ආයතනය වෙත කැඳවන ලදි.

2021 වර්ෂය ආරම්භයේ දී ආයතනය පිලිබඳ අධ්‍යයනයක් සිදු කර 2021 සිට 2025 දක්වා වසර පහක කාලයක් සඳහා තාක්ෂණික ආයතනය සඳහා නිසි ආයතනික සැලැස්මක් සකස් කරන ලදි. ක්‍රියාකාරී සැලැස්ම කාලානුරූපව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ සහතික කිරීම සඳහා යාන්ත්‍රණයක් ද හඳුන්වා දෙන ලදී. මීට අමතරව, ආයතනික සැලැස්ම මත පදනම්ව මූල්‍ය ඇස්තමේන්තුවක් ද සකස් කරන ලද අතර එය සලකා බැලීම සඳහා අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, ආයතනය සඳහා වෙන් කරන ලද අරමුදල් ඇස්තමේන්තුගත අයවැයට වඩා බෙහෙවින් අඩු විය. මේ අනුව, ආයතනයේ ඉදිරි කාර්යයන් සාර්ථකව ඉටිදිරියට සිදු කර ගෙන යාම අතිශයින් දුෂ්කර වී ඇත. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අවශ්‍ය අරමුදල් නොලැබීම හේතුවෙන් සහ ආයතනයේ මූල්‍ය කළමනාකරණයේ විවිධ ගැටළු හේතුවෙන් පසුගිය වසර හතරක කාලය තුළ ආයතනය විසින් උපයාගත් සියලුම අරමුදල් අවසන් වී ඇති බව ද නිරීක්ෂණය විය. කෙසේ වෙතත්,

සුදුසු ක්‍රියාමාර්ග හඳුන්වා දෙමින් ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය ප්‍රතිසංස්කරණය කිරීම, නිවැරදි කිරීම සහ යථා තත්ත්වයට පත් කිරීම සඳහා කඩිනම් පියවර ගන්නා ලදී.

තවද, අධ්‍යයන හා පරිපාලන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා, පහත සඳහන් කළ ප්‍රතිසංස්කරණ, ක්‍රියාමාර්ග /පියවර ගන්නා ලදී.

- නව NDT විෂය මාලාව සකස් කිරීම සහ අනුමැතිය ලබා ගැනීම.
- නව අතුරු ව්‍යවස්ථා සකස් කිරීම සහ අනුමැතිය ලබා ගැනීම.
- විභාග පැවැත්වීම සඳහා වූ ක්‍රියා පටිපාටි අත්පොත, කාර්මික පුහුණුව සඳහා වූ ක්‍රියා පටිපාටි අත්පොත සහ ශිෂ්‍ය ලියාපදිංචිය සඳහා වූ ක්‍රියා පටිපාටි අත්පොත සැකසීම.
- කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) පිහිටුවීම
- කාර්මික පුහුණුව, වෘත්තීය මාර්ගෝපදේශනය සහ පශ්චාත් ඩිප්ලෝමා අධ්‍යාපනය සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- භාෂා මධ්‍යස්ථානයක් පිහිටුවීම.

තවද, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයෙහි ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය, පර්යේෂණ සම්මන්ත්‍රණය, නව ශිෂ්‍ය බඳවා ගැනීම සඳහා orientation programme ඇතුළුව සියලුම වැදගත් වැඩසටහන් සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුකූලව වසර තුළ පවත්වන ලදී. අවසාන වශයෙන්, ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන්, 2021 වර්ෂය තුළ ITUM කාර්ය මණ්ඩලයේ ප්‍රගතිය, කාර්ය සාධනය සහ ජයග්‍රහණ පිළිබඳව මම සම්පූර්ණයෙන්ම සෑහීමකට පත්වෙමි.

මෙහෙවර

කලාපයේ ක්‍රියාශීලී තාක්ෂණ ආයතනයක් බවට පත් වෙමින් ලාංකීය ප්‍රජාවගේ අධ්‍යාපනය, ආර්ථික සහ සමාජීය දියුණුව සඳහා සක්‍රීය දායකත්වය ලබා දීම.

දැක්ම

තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

- සමාජයීය සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලීම සඳහා නම්‍යශීලී කාර්යක්ෂම අධ්‍යාපන සහ පුහුණු අවස්ථා ලබාදීම.
- නව නිපැයුම් සහ නිර්මාණශීලීත්වයට අවශ්‍ය පරිසරය ගොඩනැගීම.
- වෘත්තීය අවශ්‍යතා සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සහ ව්‍යාපාරික ප්‍රජාව සමඟ ක්‍රියාශීලී සංවාදයක් ඇති කිරීම.
- තරුණ ප්‍රජාවට සමාජීය ආර්ථික මංපෙත් විවර වන අවස්ථාවන් පුළුල් කිරීම.

පටුන පිටු අංකය

1.	අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය	**1**
	දැක්ම	**3**
	මෙහෙවර	**3**
2.	මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ අරමුණු	**10**
3.	ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ ඉතිහාසය පිළිබඳ කෙටි හැඳින්වීමක් සහ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනය ස්ථාපිත කිරීම	**11**
4.	සංවිධාන සටහන - **2021**	**15**
5.	කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්	**16**
6.	සබඳතා තොරතුරු	**17**
7.	කාර්ය මණ්ඩල හා සිසුන් පිළිබඳ විස්තර	**18**
	7.1 දේශීය සිසුන් පිළිබඳ විස්තර	**20**
	7.2 අධ්‍යාපනික හා අධ්‍යාපනික නොවන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර	**21**
8.	පර්යේෂණ , නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර	**22**
9.	වැඩසටහන් සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර	**28**
10.	ශීෂ්‍ය ක්‍රියාකාරකම්	**37**
11.	පුනරාවර්තන වියදම් පිළිබඳ තොරතුරු	**38**
12.	ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර	**38**
13.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු(වියදම්)	**38**
14.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)	**39**
15.	මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - **2021**	**39**
16.	තිරසර සංවර්ධන අරමුණු	**40**
17.	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන - **2021**	**48**
18.	විගණකාධිපතිවරයාගේ වාර්තාව	**52**
19.	විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිලිතුරු	**59**

ප්‍රතිස්ථාපනයෙන් පසු 2021 දෙසැම්බර් දක්වා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ප්‍රගතිය

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය ප්‍රතිස්ථාපනය හා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ, රු. බිලියන 10.2 ක වියදමින් තාක්ෂණ ආයතනය (ITUM) 2017 මැයි මසදී හෝමාගම දියගම ප්‍රදේශයේ සුන්දර වටපිටාවකින් හෙබි භූමියක සියලු පහසුකම් වලින් සමන්විතව ප්‍රතිස්ථාපනය කරන ලද අතර පාඨමාලා පරාසය පුලුල් කිරීම මෙන්ම බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය ඉහල නැංවීම මෙහි අරමුණ විය. ආයතනය විසින් 2020 දෙසැම්බර් මස දක්වා අත්කරගත් ප්‍රගතිය පහත විස්තර කෙරේ.

1. සිසුන් බඳවාගැනීම

තාක්ෂණ ආයතනයට (ITUM) බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය එහි ආරම්භය වන 2000 වර්ෂයේ සිටම වසර 17 ක් පුරා සිසුන් 350 සංඛ්‍යාවකට සීමා විය. කෙසේ වුවද ප්‍රතිසංවිධානයෙන් පසු 2018 වර්ෂයේ සිසුන් 480 ක් දක්වා වර්ධනය වූ අතර 2020 වර්ෂය වනවිට ආයතනයේ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාවක 800 ක් වශයෙන් සියයට සියයක් ඉක්ම වූ සීඝ්‍ර වර්ධනයකි.

විෂය ධාරාව	2019	2020	2021
රසායනික	50	50	50
සිවිල්	200	200	200
විදුලි	100	100	100
විද්‍යුත් සහ විදුලි සංදේශ	100	100	100
යාන්ත්‍රික	100	100	100
සමුද්‍ර	20	20	19
නාවික	20	20	20
බහුඅවයවික	46	50	50
රෙදිපිලි	64	60	60
තොරතුරු තාක්ෂණය	100	100	100
එකතුව	**800**	**800**	**799**

2. අර්ධවර්ෂ ක්‍රමය

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය හෝමාගම දියගම ප්‍රතිස්ථාපනය කිරීමට පෙර, තාක්ෂණ ආයතනය විසින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව වාර්ෂිකව ප්‍රදානය කරන ලදී. කෙසේ වුවද, තාක්ෂණ ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලද පුළුල් අධ්‍යනයකින් අනතුරුව 2018 වර්ෂය ආරම්භයේ සිට ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන අර්ධවාර්ෂිකව පැවැත්වීමට තීරණය කරන ලදී. ඒ අනුව වර්ෂ තුනක ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන අර්ධවර්ෂ 6 ක වැඩසටහනක් එනම් අර්ධවර්ෂ 4 ක අධ්‍යයන වැඩසටහනක් හා අර්ධවර්ෂ 2 ක පුහුණු වැඩසටහනක් ලෙසට පරිවර්තනය විය.

3. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා සාමාර්ථ

සෑම අධ්‍යයන අර්ධවර්ෂයක්ම සාමාර්ථ 25 කින් යුක්ත වන අතර සෑම පුහුණු අර්ධවර්ෂයක්ම සාමාර්ථ 06 කින් යුක්ත වේ. ඒ අනුව ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා සම්පූර්ණ සාමාර්ථ සංඛ්‍යාව 112 කි.

4. මූල්‍ය හා පරිපාලන

2017 වර්ෂයේදී අනුමත කරන ලද කාර්ය මණ්ඩල තනතුරු අභ්‍යන්තර මාරුකිරීම උසස් කිරීම් සහ බාහිර අයදුම්පත් කැඳවීම තුලින් බඳවා සම්පූර්ණ කිරීමට ආයතනයට හැකිවිය.

ආයතනයේ අධ්‍යයන අංශ නම්:

බහුඅවයවික සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය

යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය

සමුද්‍ර ඉංජිනේරු තාක්ෂණය

රෙදිපිලි සහ ඇඟලුම් තාක්ෂණය

සිවිල් ඉංජිනේරු තාක්ෂණය

අන්තර් විනය අධ්‍යයන

විදුලි , විද්‍යුත් සහ සන්නිවේදන තාක්ෂණය

තොරතුරු තාක්ෂණය

සම්බන්ධීකරණ නිලධාරියෙකුගේ මූලිකත්වයෙන් අන්තර් විනය අධ්‍යයන අංශය යටතේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකයක් (ELTU) ස්ථාපිත කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. බොහෝ දුෂ්කරතා මගහරවාගෙන කළමනාකරණ මණ්ඩලය වෙත මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ ජයග්‍රහන වාර්තා කිරීමට 2021 වර්ෂය තුළදී අධ්‍යක්ෂවරයා සමත් විය.

5. <u>අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය</u>

- ආචාර්ය සී. සුජීව ලෙවන්ගමගේ මහතා 2020.10.02 වන දින සිට 2021.02.14 වන දින දක්වා ආයතනයේ නිසි බලධාරියා ලෙස සේවය කරන ලදි.
- මේජර් ජනරාල් (විශ්‍රාමික) එස්.කේ. තිරුණාවුකරසු මයා 2021.02.16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ අධ්‍යක්ෂ තනතුරට පත් වන ලදි.

6. <u>තත්ව සහතික ඒකකය</u>

පිළිගත් ප්‍රමිතීන් හා එකඟ වූ අභ්‍යන්තර තත්ව සහතික පද්ධතියක අවශ්‍යතාවය ආයතනයට දිගු කාලයක සිට පැවතුනි. මෙම අරමුණ සපුරාගනු වස්, තත්වය සහතික කිරීම, අඛන්ඩ සංවර්ධනය සහ කාර්යක්ෂම කාර්යසාධනය යන කරුනු සහතික කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව සම්බන්ධීකරන නිලධාරියෙකුගේ මූලිකත්වයෙන් තත්ව සහතික ඒකකයක් පිහිටුවන ලදී. ඒ අනුව සියලු වැඩසටහන් ඉගැන්වීම් ක්‍රියාපටිපාටි තත්ව ආකෘතීන්ට අනුව හැඩගස්වා භාවිතයට ගන්නා ලදි. එම සියලු වැඩසටහන්වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා තත්ව සහතික කිරීමේ ඒකකය 2021 වර්ෂය තුලදී තව දුරටත් සංවර්ධනය කරන ලදි.

7. <u>සිසුන්ට ආයතනය තුළ නේවාසික සහ අනෙකුත් පහසුකම් සැපයීම.</u>

සියලු සිසුන් සඳහා නේවාසික පහසුකම් සැපයීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ. මේ අනුව සිසුන් 1600 ක් සඳහා නේවාසික පහසුකම් ලබා දී ඇත. සිසුන් සියලුම දෙනා පාහේ පරීශ්‍රය තුළ නේවාසිකව සිටී. සිසුන්ගේ කායික හා මානසික යහපැවැත්ම වර්ධනය කිරීමේ අරමුනින් අත්දැකීම් සහිත ශාරීරික අධ්‍යාපන උපදේශකවරු දෙදෙනෙකුගේ මගපෙන්වීම යටතේ අංග සම්පූර්ණ ව්‍යායාම් ශාලාවක් සහ ගෘහස්ත හා එලිමහන් ක්‍රීඩා පහසුකම් හා බිම් මට්ටමේ සේවක මණ්ඩලයක සහය ඇතිව සිසුන් සඳහා ක්‍රීඩා පහසුකම් සලසා දී ඇත. සියලුම සිසුන් වෙනුවෙන් නාමික මිලකට ආහාර සැපයීම සඳහා ආයතනයේ සහනාධාර ලබන ආපනශාලා දෙකක් ක්‍රියාත්මක වේ. කාර්යාල වේලාව තුල සුදුසුකම්ලත් වෛද්‍ය කාර්යමණ්ඩලයක්

යටතේ වෛද්‍ය මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක වන අතර රාත්‍රී කාලයේ දී සේවා අවශ්‍යතාවය මත ප්‍රවාහන සේවාවක් ක්‍රියාත්මක වේ.

8. තාක්ෂණ ආයතන (ITUM) කාර්යය මණ්ඩලයට සුභසාධන පහසුකම් සැපයීම

කාර්යයමණ්ඩලය සඳහා අවශ්‍යතාවය මත නිලනිවාස ලබා දී ඇත. ඊට අමතරව, බොහෝ අධ්‍යන හා අනධ්‍යන කාර්යමණ්ඩල සාමාජිකයන් සඳහා නේවාසිකාගාරවල ඉතිරි වී ඇති කාමරවල නවාතැන් පහසුකම් සලසා දී ඇත. කාර්යයමණ්ඩල ආපන ශාලාවක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සේවක සුභසාධක සංගමයේ අධීක්ෂණය යටතේ ලබා දීමට ආයතනයට හැකි වී ඇත. හෝමාගම ලංකා බැංකුවේ ශාඛාවක් තාක්ෂණ ආයතන වෙළඳ සංකීර්ණයේ ස්ථාපිත කර සිසුන්ට හා කාර්යය මණ්ඩලයට බැංකු පහසුකම් සලසා දී ඇත.
කාගිල්ස් ෆුඩ් සිටි ශාඛාවක් එම වෙළඳ සංකීර්ණයේ ස්ථාපිත කර නේවාසික කාර්ය මණ්ඩලයේ හා සිසුන් ගේ අවශ්‍යතා සපුරා ගැනීමට පහසුකම් සලසා දී ඇත.

අනාගත සැලසුම්

නව සංකීර්ණයේදී සිසුන් බඳවා ගැනීම වසරකට 1000 ක් දක්වා වැඩි කිරීමට මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය සැලසුම් කර ඇත. එමනිසා මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා බඳවා ගැනීම් ක්‍රමානුකූලව වැඩි කෙරෙනු ඇත.

අධ්‍යන වැඩසටහන් මාර්ගගත ක්‍රමයට ලබාදීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ තත්ව සහතික ඒකකය මගින් සංවර්ධනය කර ඇත. අධ්‍යනාංශ සිය ජාතික මෙහෙවර සමාජීය සහ කාර්මික අවශ්‍යතා සමග අත්වැල් බැඳගනිමින් පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන් හඳුන්වාදෙමින් ඉටුකරීමට සැලසුම් සකස් කරමින් සිටියි.

NDT වැඩසටහනට නව විෂයයන් ඇතුලත් කිරීමට/ හඳුන්වා දීමට සහ තක්ෂණික අධ්‍යාපනයක්සඳහා වන ගෝලීය ඉල්ලුමට විසඳුම් සෙවීම සඳහා විෂයමාලා සමාලෝචනය කිරීමට ද කටයුතු යොදා ඇත.

තාක්ෂණ ආයතන පහසුකම්

ආදායම් උත්පාදනය කිරීමේ අරමුනින් බහුකාර්ය ශාලාව, ශ්‍රවනාගාරය, මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානය, තානායම් සහ සාප්පු සංකීර්ණය වෙළඳ දැන්වීම් මගින් ප්‍රවර්ධනය කෙරේ.

සූර්යබල පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා සහ විදුලිබිල පියවාගැනීම සඳහාඅරමුදල් උත්පාදනය කිරීමේ හැකියාව සොයාබැලීමට ශක්‍යතා අධ්‍යනයක් ආරම්භ කර ඇති අතර තාක්ෂණ ආයතනයේ සාප්පු සංකීර්ණයේ ඇති සියලු කඩසාප්පු සහ පොදුපහසුකම්, ප්‍රමුඛතාවය මත මහජනතාවට කුලියට ලබාදීමට පියවර ගෙන ඇත.

පුස්තකාල පහසුකම්

ආයතනයේ අධ්‍යයන කාලය තුළ තොරතුරු සහ අධ්‍යයන පරිසරය වෙත කාලෝචිත හා ඵලදායී ප්‍රවේශයක් ලබා දීමෙන් පුස්තකාලය ඉගෙනීමට, ඉගැන්වීමට සහ පර්යේෂණ සඳහා සහාය වේ. http://opac.itum.mrt.ac.lk අන්තර්ජාල නාමාවලිය හරහා ප්‍රවේශ විය හැකි මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික සම්පත් රාශියක් එය සංරක්ෂණය කරයි. ආයතනික අධ්‍යයන කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා පුස්තකාලය හරහා බොහෝ සේවාවන් සහ පහසුකම් සපයනු ලැබේ. පුස්තකාලය ITUM-ප්‍රධාන ගොඩනැගිල්ලේ 2 වන මහලේ (U2) ඇත. අපගේ විවෘත වේලාවන් උදේ 8.30 සිට සවස 5.15 දක්වා වේ. සතියේ දිනවල සහ 8.30 සිට 4.15 දක්වා. සෙනසුරාදා දිනවල සහ විභාග කාල සීමාවන් තුළ දීර්ඝ කරන ලද වේලාවන් සපයනු ලැබේ. තාක්ෂණික දැනුමේ ලෝකය ගවේෂණය කිරීමට අපි සියලු දෙනා සාදරයෙන් පිළිගනිමු! (http://web.itum.mrt.ac.lk/library).

02. ආයතනයේ අරමුණු

අරමුණ 01	උසස් තාක්ෂණය සහ තාක්ෂණික පරිණාමයේ කලාපීය පෙර ගමන් කරුවෙකු වීම සහ දේශයේ තිරසාර සංවර්ධනය මෙන්ම ගෝලීය ඉල්ලුමට සරිලන සුදුසුකම් පරිපූර්ණ බහුවිධ හැකියාවෙන් යුතු වෘත්තිකයන් බිහි කිරීමේ නායකත්වය දැරීම
අරමුණ 02	තාක්ෂණික දියුණුව පිළිබඳ පර්යේෂණ සඳහා මධ්‍යස්ථානයක් බවට පත් වීම
අරමුණ 03	සිසුන්ගේ පරිපූර්ණ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ උපාය මාර්ගික පරිසරයක් නිර්මාණය කිරීම
අරමුණ 04	ඉගැන්වීමේ සහ ඉගෙනීමේ විශිෂ්ටත්වයට කැපවූ සුදුසුකම් ලත් අභිප්‍රේරිත කාර්ය මණ්ඩලයක් ඇති කිරීම සඳහා උපාය මාර්ග සැකසීම
අරමුණ 05	විධිමත් පරිපාලන යාන්ත්‍රණයක් සහිත මූල්‍යමය ස්ථාවරත්වයකින් යුතු ආයතනනයක් බවට පත් වීම
අරමුණ 06	විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා ආයතනය සතු පහසුකම් නවීකරණයට ලක්කිරීම
අරමුණ 07	ඩිජිටල් පරිවර්තන ක්‍රමවේදය තුලින් අයතනයේ මෙහෙයුම් විශිෂ්ටත්වයට ලඟා කර ගැනීම
අරමුණ 08	ආයතනයේ සෑම මට්ටමකම ඉහළ ප්‍රමිතියකින් යුතු තත්ව කලමණාකරන පද්ධතියක් ස්ථාපිත කර තහවුරු කිරීම.

03. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සහ මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනය පිහිටුවීමේ ඉතිහාසය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ මුල් ආරම්භය මරදාන කණිෂ්ඨ කාර්මික විද්‍යාලය දක්වා දිවෙයි. ඒ එමගින් ලබා දුන් දැවුරුදු කණිෂ්ඨ කාර්මික නීලධාරී පාඨමාලාව හා ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධිය සඳහා සිසුන් සූදානම් කරමින් ලබාදුන් සිවි අවුරුදු තාක්ෂනික ඩිප්ලෝමාව නිසාවෙනි. කණිෂ්ඨ තාක්ෂණික නිලධාරී පාඨමාලාව ඉතා හොඳ පිලිගැනීමකින් යුත් මැදි මට්ටමේ තාක්ෂණ පාඨමාලාවක් වූ අතර එය සම්පූර්ණ කල අයවළුන් රටෙහි ඉංජිනේරු අංශයේ දියුනුවට විශාල වශයෙන් දායක විය.

1960 වර්ශයේදී මොරටුව කටුබැද්දේ ප්‍රායෝගික තාක්ෂණ ආයතනය (Institute of Practical Technology) (IPT) පිහිටුවීමත් සමග කණිෂ්ඨ තාක්ෂණ නිලධාරී පාඨමාලාව මරදානේ සිට මොරටුවට මාරු කරන ලදි. ප්‍රායෝගික භාවිතය සඳහා අරමුණු කරගත් මධ්‍යම මට්ටමේ ඉංජිනේරු තාක්ෂණ පාඨමාලා සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා කැනඩා රජයේ ආධාර මත ප්‍රායෝගික තාක්ෂණ ආයතනය ආරම්භ කරන ලදී.

ප්‍රායෝගික තාක්ෂණ ආයතනය 1966 වසරේදී ලංකා තාක්ෂණ විද්‍යාලය ලෙස උසස් කරන ලද අතර එහි සීඝ්‍ර පාඨමාලා විවිධාංගීකරණයක් සිදුවිනි. ලංකා තාක්ෂණ විද්‍යාලය මගින් පස් අවුරුදු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කළ අතර කණිෂ්ඨ කාර්මික නීලධාරී පාඨමාලාවට වසරක කර්මාන්තශාලා තුල පුහුණුවක් හදුන්වා දී එය ජාතික තාක්ෂණ ඩිප්ලෝමාවට (NDT) සුදුසුකම් ලබන තුන් අවුරුදු පාඨමාලාවක් බවට පත්කෙරිණි. 1972 දී ලංකා තාක්ෂණ විද්‍යාලය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ සරසවියක් ලෙස උසස් වී පසුව මොරටුව විශ්වවිද්‍යාලය ලෙස ක්‍රමයෙන් වර්ධනය විය. ඉන්පසු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් මොරටුව විශ්ව විද්‍යාලය මගින් පවත්වාගෙන යන ලදි.

1987 වර්ශයේදී ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව 1978 අංක 16 විශ්ව විද්‍යාල පනතේ 29 (ඉ) වගන්තිය යටතේ මොරටුව විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාඨමාලාවක් බවට පත්වුනු අතර ඒ සඳහා ඇතුලත් වීමේ අධ්‍යාපන සුදුසුකම ලෙසට අ.පොස. උසස් පෙළ පිලිගැනින. මූලික වශයෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව හා ඒ හා සමාන මට්ටමේ පාඨමාලා හැදෑරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය යටතේ ඇති ආයතනයක් ලෙස මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනය (ITUM) 2000 අංක 3 දරණ ආඥා පනත යටතේ 2000 වර්ශයේදී ආරම්භ කරන ලදී. මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනය කළමණාකරන මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වන අතර පාඨමාලා ස්වාධීනව සංවර්ධනය කිරීම සඳහා ආයතනය වෙනම ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ගැන කෙටි හැඳින්වීමක්.

පරමාර්ථය වන්නේ අපේ රටේ කර්මාන්ත සඳහා විවිධ අංශවලින් අවශ්‍ය ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමයි. ආයතනය විසින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන විෂයයන් දහයකින් මෙහෙයවනු ලබන අතර එහි මුළු ඇතුලත් කරගැනීම් සංඛ්‍යාව 800 කි. ආයතන විසින් ලබාදෙන පාඨමාලා පහත පරිදි වේ.

රසායනික ඉංජිනේරු තාක්ෂණය	**-**	**50**
සිවිල් ඉංජිනේරු තාක්ෂණය	**-**	**200**
විදුලි ඉංජිනේරු තාක්ෂණය	**-**	**100**
විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය	**-**	**100**
සමුද්‍ර ඉංජිනේරු තාක්ෂණය	**-**	**20**
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය	**-**	**100**
නාවික අධ්‍යයන	**-**	**20**
බහුඅවයවික තාක්ෂණය	**-**	**50**
රෙදිපිළි හා ඇඳුම් තාක්ෂණය	**-**	**60**
තොරතුරු තාක්ෂණය	**-**	**100**

මීට අමතරව, ත්‍රිවිධ හමුදාවට සහ විශ්ව විද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයට උපරිම බඳවා ගැනීම් 5 ක් දක්වා වෙන් කෙරේ.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුලත් කරගැනීම විධිමත් ක්‍රියාවලියක් තුලින් සිදුකෙරේ. පසුගිය වසර තුනක් දක්වා උසස් පෙල විභාග වලට පෙනී සිට එක් වරකදී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය සහ උසස් ගණිතය යන විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගත් සිසුන්ට මේ සඳහා අයදුම් කළ හැක. Z- ලකුණු, පදනම් කරගෙන තෝරා ගනු ලබන සිසුන් පසුව යෝග්‍යතා පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු මත තෝරා ගනු ලැබේ.

අංග සම්පූර්ණ ඩිප්ලෝමාධාරියකු ක්ෂේත්‍රයේ වෘත්තීය ඉංජිනේරුවෙකු හෝ කළමණාකරුවකු හා ශ්‍රම බලකාය අතර අතරමැදි සම්බන්ධීකාරකයකු වශයෙන් කටයුතු කිරීම අපේක්ෂා කරයි. මෙම භූමිකාව සඳහා ඩිප්ලෝමාධාරියකු වෘත්තීමය වශයෙන් සංවර්ධනය කිරීම සහ ඔහු/ඇයගේ සන්නිවේදනය සහ කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. ඔහු / ඇය තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍රය තුළ අධ්‍යාපනය ලැබිය යුතු අතර එමඟින් ඔහුට / ඇයට වෘත්තීය ඉංජිනේරුවරයාගේ නවෝත්පාදන / නිර්මාණ අගය කිරීමට හැකි වන අතර යටත් නිලධාරීන් සමඟ සන්නිවේදනය කර එම නවෝත්පාදන / නිර්මාණ යතාර්ථයක් බවට පත් කිරීමටත් හැකි විය යුතුය.

මේ අනුව පාඨමාලාව වසර දෙකක අධ්‍යයන කාලයකින් හා අර්ධ වාර්ෂික 6 කින් යුතු වසරක කාර්මික පුහුණුවකින් සමන්විත වේ. පළමු හා දෙවන අර්ධවර්ෂ අධ්‍යයන වාරයේ විෂය කොටස් ප්‍රධාන වශයෙන් නිර්මාණය කර ඇත්තේ මූලික විද්‍යාවන්හි ශිෂ්‍යයාගේ දැනුම සමාන කිරීම, ඒකාබද්ධ කිරීම සහ වැඩිදියුණු කිරීම සහ ඔහු / ඇය විසින් තෝරාගෙන ඇති විශේෂිත අධ්‍යයන පථය හඳුන්වා දීම සඳහා ය. ඉංජිනේරු පුහුණුව සඳහා අවශ්‍ය මූලික කුසලතා කිහිපයකටද මෙහිදී සිසුන් නිරාවරණය වනු ඇත (උදා: කර්මාන්තශාලා තාක්ෂණය හා ඉංජිනේරු ඇඳීම).

පහත සඳහන් හේතු නිසා ඉංග්‍රීසි භාෂාව පළමු හා දෙවන අර්ධ වර්ෂ වල අනිවාර්යය විෂයකි.

i. ජාතික තාක්ෂන ඩිප්ලෝමා පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. බොහෝ සිසුන් අ.පොස. උසස් පෙළ දක්වා සිය අධ්‍යාපන කටයුතු සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් සිදුකර ඇති නිසා ඉංග්‍රීසි භාෂා මොඩියුල සන්නිවේදන ප්‍රවීනතා වර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් පිළියෙල කර ඇත.

ii. සන්නිවේදනය ඩිප්ලෝමා ධාරියාගේ වෘත්තීය චර්යාවෙහි වැදගත් භූමිකාවක් හොබවයි. එබැවින් සිසුන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අවබෝධය කථන හැකියාව සහ වාර්තා රචනය පිලිබඳ සිය කුසලතාවයන් සංවර්ධනය කර ගතයුතු වේ.

තුන්වන හා හතරවන අර්ධවර්ෂ වල විෂය කොටස් සිසුන් විසින් තෝරාගන්නා ලද විෂය ක්ෂේත්‍රයෙහි ඉංජිනේරු සංසිද්ධි භාවිතයන් ප්‍රධාන වශයෙන් අඩංගු වේ.

පස්වන හා සයවන සයමාසික අදාල කර්මාන්තයෙහි ප්‍රායෝගික පුහුණුව ලබාගැනීම සඳහා වෙන්කෙරේ. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) තාක්ෂණ ආයතනයේ (ITUM) පුහුණු ඉංජිනේරු සමග එක්ව පුහුණුව සඳහා ආයතන සපයා දීම සිදු කෙරේ.

විශ්ව විද්‍යාලය විසින් අනුමත කාර්ය සාධන ක්‍රමවේද අනුව වසර තුනක අධ්‍යාපනය සහ පුහුණුව සාර්ථකව අවසන් කළ සිසුන් සඳහා ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය සාමාන්‍ය, සම්මාන හෝ විශිෂ්ඨතා සාමාර්ත සහිතව පිරිනැමේ.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමාධාරීන් සුදුසුකම් සපුරා වර්ශයක් ඇතුලත ඔවුන්ගේ සේවා නියුක්තතාව 100% බව පසුවිපරම් අධ්‍යනයන්ගෙන් හෙලිවී ඇත.

මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ක්‍රියාත්මක අධ්‍යාපන විෂය නිර්දේශය 2005 වර්ෂයේදී පලමුවසර සිසුන් සඳහා හඳුන්වාදෙන ලද අතර 2006 වර්ෂයේදී දෙවන වසර සිසුන් සඳහා

හඳුන්වාදෙන ලදි. එහි අරමුණ කාර්මික ලෝකයේ වර්තමාන දියුනු තාක්ෂණ ක්‍රමවේදයන් ඒ හා සමානවම පවත්වා ගනිමින් තෝරාගත් අධ්‍යන ක්ෂේත්‍ර වල සිසුන්ගේ දැනුම පුළුල් කිරීම වේ.

දීර්ඝ කාලයකට පසුව තාක්ෂණ ආයතනයේ (ITUM) ප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය මගින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා විෂය නිර්දේශය සංවර්ධනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදුකළ අතර අධ්‍යන කටයුතු 2018 වර්ෂයේ සිට වාර්ෂික පදනමින් සයමාසික පදනමට වෙනස් කරන ලදි.

4. සංවිධාන ව්‍යුහය – මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය



5. කළමණාකරණ මණ්ඩලයේ සාමාජිකයින්

1.	මේජර් ජෙනරාල් (විශ්‍රාමික) එස් කේ තිරුණාවුකරසු	අධ්‍යක්ෂ (2021.02.16 සිට)
2.	එස් එච් එල් ගමගේ මහතා	උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජිත
3.	ඒ. ඩබ්ලිව් සෙනෙවිරත්න මහතා	නාවික අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජිත
4.	ආර්.එම්.ඒ.පී. සමරදිවාකර මිය	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ සභාපතිගේ නියෝජිත
5.	මහාචාර්ය එන්. කේ. වික්‍රමාරාච්චි	පීඨාධිපති, ඉංජිනේරු පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය
6.	ඩී. පී. චන්ද්‍රසේකර මහතා	පීඨාධිපති, වාස්තු විද්‍යා පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය
7.	මහාචාර්ය කල්‍යාණී පෙරේරා මිය	සභා නියෝජිත (2020.02.22 සිට 2023.02.21 දක්වා)
8.	මහාචාර්ය ඒ.එස්. කරුණානන්ද මහතා	සෙනෙට් නියෝජිත (2020.07.22 සිට)
9.	ජී.ජී. ජයරත්න මහතා	අධ්‍යාපන මණ්ඩලයේ නියෝජිත ITUM (2020.10.12 සිට 2023.10.11 දක්වා)
10.	ආචාර්ය එම්.සී.ඩබ්ලිව්. සෝමරත්න	අධ්‍යාපන මණ්ඩලයේ නියෝජිත ITUM (2020.11.10 සිට 2023.11.09 දක්වා)
11.	ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත (2020.01.16 සිට 2023.01.15 දක්වා)
12.	ආචාර්ය චරිත් ජයතිලක	
13.	එන්. කේ. අබේරත්න ඩයස් මිය	

06. සම්බන්ධතා තොරතුරු

ලිපිනය

තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

දියගම

හෝමාගම

ශ්‍රී ලංකාව

දුරකතනය

අධ්‍යක්ෂ 0112124001

පොදු 0112124000

ෆැක්ස් 0112117030

විද්‍යුත් ලිපිනය director@itum.mrt.ac.lk



07. කාර්ය මණ්ඩල සහ සිසුන් පිළිබඳ විස්තර

අධ්‍යයන අංශ	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය		මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
සිවිල් ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	712 (17,18,19 & 20 කණ්ඩායම්)	කථිකාචාර්යවරු P – 12 V – 04 C – 01	උපදේශකවරු T – 7 V – 6	P - 07 C - 02
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	276	කථිකාචාර්යවරු P – 09 C – 01	උපදේශකවරු T - 06 V – 11	P - 27
සමුද්‍ර ඉංජිනේරු අංශය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	119	කථිකාචාර්යවරු P – 01 V – 00 C – 01	උපදේශකවරු T – 00 NDA L-09 NDA I- 02	P- 02 C- 02
බහු අවයවික සහ රසායන ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	245	කථිකාචාර්යවරු P – 08 V – 01 C – 04	උපදේශකවරු T – 06	P- 13
රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	180	කථිකාචාර්යවරු P – 03 V – 03	උපදේශකවරු T – 01 V – 00	P - 08 T - 01
විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	600	කථිකාචාර්යවරු P –10 V – 02 T – 02	උපදේශකවරු T – 07 V – 01	P- 12
අන්තර්විෂය මාලා අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	Semester 1 – 800 Semester2 - 800 Semester 3 – 760 Semester 4 – 160	කථිකාචාර්යවරු P – 11 C - 01 V –13	උපදේශකවරු T – 02 V – 09	P – 03
තොරතුරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	300	කථිකාචාර්යවරු P – 06 V – 08 C - 01	උපදේශකවරු T – 04 V – 02	P-02

P – ස්ථිර
C - කොන්ත්‍රාත්
T - තාවකාලික
V - බාහිර
NDA L -ජාතික ඩිප්ලෝමා සංගමය කථිකාචාර්යවරු
NDA I -ජාතික ඩිප්ලෝමා සංගමය උපදේශකවරු

තාක්ෂණික ආයතනයේ කාර්යය මණ්ඩලය

සේවක සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව සේවක	පවත්නා සංඛ්‍යාව සේවක	පුරප්පාඩු සංඛ්‍යාව සේවක
ජෙෘෂ්ඨ	84	67	17
තෘතියික	83	71	12
ද්විතීයික	68	45	23
ප්‍රාථමික	80	63	17
එකතුව	**315**	**246**	**69**

7.1 සිසුන් පිළිබඳ විස්තර

ආයතනයට සිසුන් **800** ක් ඇතුලත් කරගනු ලබන අතර ක්ෂේත්‍ර 10 කින් සමන්විත වේ. එනම් රසායනික, පේෂකර්ම, පොලිමර්, සිවිල්, විදුලිය, විද්‍යුත් හා විදුලි සන්දේශ, නාවික, යාන්ත්‍රික හා නාවුක වේ.

අධ්‍යයන අංශය	පාඨමාලාව	සිසුන් ඇතුලත් කිරීම 2021	දෙවන සය මාසික සිසුන්	සිවවන සය මාසික සිසුන්	කාර්මික පුහුණු සිසුන්	මුළු ඩිප්ලෝමාධාරී සිසුන්
සිවිල් ඉංජිනේරු තාක්ෂණ.	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	200	200	192	120	77
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	100	100	100	100	52
සමුද්‍ර අධ්‍යයන අංශය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	39	40	Semester - 37 Annual - 04	40	20
බහු අවයවික සහ රසායන ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	100	99	89	57	41
රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	60	60	60	60	52
විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	200	200	200	200	86
අන්තර්විෂය මාලා අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	800	800	160		-
තොරතුරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	100	100	100	96	-
Total		**1599**	**1599**	**942**	**673**	**328**

7.2 අධ්‍යයන සහ අනධ්‍යන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර (2021.12.31)

කාර්ය මණ්ඩල වර්ගය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවන සංඛ්‍යාව	පුරප්පාඩු
අධ්‍යයන කාර්ය මණ්ඩලය	U-AC 3 to U-AC 5	79	63	16
	U-AC 1 to U-AC 2	50	35	15
ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	U-EX 1 to U-EX 3 (Administrative & Financial Staff)	07	07	-
	U-EX 1 to U-EX 3 (Other Executive Staff)	01	-	01
වෛද්‍ය නිළධාරී	U-MO 1	01	-	01
අධ්‍යයන සහයක කාර්යය මණ්ඩලය	U-AS 1 U-AS 2,2	10	03	07
තාක්ෂණික කාර්යය මණ්ඩලය	U- MT 1	38	29	09
ලිපිකරු හා සමාන	U-MN 1 U-MN 2,3 U-MN 4	45	42	03
ප්‍රාථමික කාර්ය මණ්ඩලය	U-PL 1 to U-PL 3	84	67	17
එකතුව		**315**	**246**	**69**

08. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ කාර්යමණ්ඩලය විසින් සිදුකරනලද පර්යේෂණ වල සොයාගැනීම් දේශීයව සහ ජාත්‍යන්තරව ඉදිරිපත් කර ප්‍රසිද්ධ කර ඇත.

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / ජර්නලය / පොත් / ප්‍රවේශ වූ දිනය
ආචාර්ය එන්. පී. කේ. සේමානන්ද මිය ජේ. ඩී. වෝඩ් බී. ආර්.මයර්ස්	*Assessing Reliability of Recycled Water in Wicking Beds for Sustainable Urban Agriculture*	Journal: Earth; 29 July 2021 https://doi.org/10.3390/earth2030028
ආචාර්ය ඩබ්.බී.එම්. තෝරදෙනිය	*Farmer Organisations of Small Irrigation Schemes in Sri Lanka; Current status"*	International Symposium: International Network for Water and Eco systems in Paddy Fields (INWEPF) 2021. 2nd November 2021
එම්. එම්. පී. ඩී. සමරසේකර මිය	*Effectiveness of assessments on levels of learning and learning outcomes: A case study in Engineering Technology Education*	3rd South Asia Conferance on Interdisciplinary Research 2021, 05 November 2021
ටී කජාහරන් මයා	Buildings titled *Sustainable Performance of a Modular Building System Made of Built-Up Cold-Formed Steel Beams.* Engineering Structures titled *Shear behavior of doubly symmetric rectangular hollow flange beam with circular edge-stiffened opening*	Journal: Buildings 8 October 2021 http://dx.doi.org/10.3390/buildings11100460 Journal: Engineering Structures 1 January 2022 http://dx.doi.org/10.1016/j.engstruct.2021.113366
ඒ. යූ. වී. බී. බුලත්සිංහල මයා පී. එම්. බී. එම්. උදයංග මයා ආචාර්ය ඩබ්.බී.එම්. තෝරදෙනිය	*Seasonal variations of groundwater pH value: Interim results of a case study at Gampaha district*	ITUM Research Symposium, 2021

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / ජර්නලය / පොත් / ප්‍රවේශ වූ දිනය
අමාෂිනී කාරියවසම් මිය ආචාර්ය ඩබ්.බී.එම්. තෝරදෙනිය	*Community agreement on social and environmental impacts of Mini Hydro Power Generation: A case Study*	SLEMA Journal, March 2021 (Accepted for publication)
Note: There can be more. They will be updated through this link. **https://docs.google.com/spreadsheets/d/10LSEPSRGK47dOEkJZTLaJ0CCQ3gmydDUDQ80JpuCuXE/edit#gid=0**		
ආචාර්ය එස් සපරමාදු මිය මහාචාර්ය සමන් බණ්ඩාර මයා	Estimating Passenger Delays at Airport Terminal Service Centers.	7th International Multidisciplinary Engineering Research Conference MERCON 2021. July 27 - July 29, 2021.
ආචාර්ය එස් සී මතුගම මිය	Use of Practical based online teaching and continuous assessment methods to entrance student performance	7th Annual SLAIHEE Conference on 30th July 2021, held online via zoom
ජේ. ඒ. එස්. ඩී. බණ්ඩාර එච්. එම්. ඩී. එස්. කේ. නවරත්න එස්. වීරසිංහ ඒ. එම්. ජී. සී. පී. අධිකාරි	Investigation of physical fitness and body composition profile of elite Karate Kumithe Athletics in Sri Lanka.	Ruhuna International Science & Technology Conference 2021.02.17
ජේ. ඒ. එස්. ඩී. බණ්ඩාර ඩී. පී. යූ. යූ. බණ්ඩාර එස්. වීරසිංහ	**Influence to fuel consumption with advanced technology in modern automobile construction**	තාක්ෂණ ආයතනයේ (ITUM) පර්යේෂණ සම්මන්ත්‍රනය **2019**

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / ජර්නලය / පොත් / ප්‍රවේශ වූ දිනය
එස්. නාගොඩවිතාන පී. බී. ටී. කේ. ප්‍රේමරත්න	A Study of Vocabulary Learning Strategies and their Effect on Vocabulary Development	Journal of English Language Teaching and Applied Linguistics Vol 3 (Issue 2) DOI: https://doi.org/10.32996/jeltal.2021.3.2.7 Date Published: 27 February 2021
පී. බී. ටී. කේ. ප්‍රේමරත්න සී. ඩී. එච්. එම්. ප්‍රේමරත්න	The Pedagogical Effect of Teacher and Student- Centered Corrective Feedback Moves on Pronunciation Intelligibility	International Journal of Scientific Scientific and Research Publications (IJSRP), 11(2) (ISSN: 2250-3153), DOI: http://dx.doi.org/10.29322/IJSRP.11.02.2021.p11086 Date published: 21 February 2021
ඩබ්. ඊ. ඉරෝෂිනී එල්. පී. කුමාරසිරි පේ. ඒ. එස්. ඩී. බණ්ඩාර ඒ.කේ.ඩී.කේ. චතුරංගි එස්. ඒ. අයි. එම්. සමරවීර	Technology students' Perception of the Humanities Modules: A case study of NDT students at ITUM.	ITUM Research Symposium 2021.09.29
ඒ. ඩබ්. සී. කේ. අටුගොඩ එම්. ඒ. යූ. කේ. ප්‍රේමරත්න	Statistical Models for Long Term Network Traffic in Enterprise Network.	Conference, ITUMRS 2021, May
එම්. වී. පී. ටී. ලක්ෂිකා එච්. ඒ. කල්දේරා	"Knowledge Graphs Representation for Event-Related E-News Articles"	Machine Learning & Knowledge Extraction (MAKE) open-access Web of Science scientific journal by Multidisciplinary Digital Publishing (MDPI) Institute, Basel, Switzerland.

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / ජර්නලය / පොත් / ප්‍රවේශ වූ දිනය
එච්. ඩී. ජයතිලක එන්. පී. බරුපල පේ. ඒ. ජයතිලක එච්. එම්. ජයතිලක	Gamified Feedback and Job Satisfaction of Generation-Z Software Professional in Post-COVID-19 Environment"	'International conference in Data science (ICDS) – 2021 organized by University of Colombo on 29th and 30th June 2021
එම්. අයි. එම්. අම්ජාත් එස්. කුහනේසන්	TrackWarn: An AI-driven warning system for railway track workers	2021 International Research Conference on Smart Computing and Systems Engineering (SCSE)
කේ. ගලප්පත්ති එස්. කුරුප්පු	"A data mining approach to identify associations between job titles and skills in job vacancies"	International Conference on Advanced Research in Computing(ICARC) -2021, University of Sabaragamuwa
එල්. ජී. චමත්	Determination of transverse thermal conductivity of coir fibres by analytical methods.	IESL Young Members Technical conference 2021
පේ. එම්. පී. ගුණසේකර	CHARACTERISTIC EVALUATION OF PID CONTROL USING A DC MOTOR AS A DEMONSTRATION DEVICE	ITUM Research symposium 2021
පී. ඩී. සී. කුමාර	**Performance analysis of two condenser models used for solar energy -assisted water distillation**	Modelling Earth System and Environment

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / ජර්නලය / පොත් / ප්‍රවේශ වූ දිනය
එම්. කේ. සී. මධුවන්ති ජී. කේ. ජයතුංග බී. එම්. ඩබ්. පී. කේ. අමරසිංහ	Drying kinetics, moisture diffusivity, and heat & mass transfer characteristics of Sri Lankan parboiled paddy dried in a spouted bed dryer	Trends in Chemical Engineering December 2021
පේ්. කේ. ජී. එන්. ජයකොඩි එම්. ඩී. ඒ. එස්. මවනායක එච්. ඒ. අයි. එස්. හෙට්ටිආරච්චි ඩී. ආර්. එම්. ඒ. කරුණාරත්න ආර්. ඩී. එස්. රංචල කේ. ඩී. ජී. එම්. අළුත්ගම ජී. කේ. ජයතුංග	Effect of carbonization conditions of coconut shell charcoal on color removal using adsorption in wastewater treatment	ITUM Research Symposium 29th September 2021
අයි. ආර්. සමරතුංග පී. ජී. රත්නසිරි	Effect of volumetric loading of skim latex wastewater on anaerobic sulfate reduction	7th Moratuwa Engineering Research Conference 2021 (MERCon 2021) 27th July 2021
අයි. ආර්. සමරතුංග පී. ජී. රත්නසිරි	Effect of type of electron donor on sulfate reduction	ITUM Research Symposium 2021 29th September 2021
අයි. ආර්. සමරතුංග	Student and staff perceptions on a restructured practical class assessment to increase student engagement and performance	17TH Annual SLAIHEE conference on higher Education Sri Lanka 30.0.2021
ඩබ්. වී. ඩබ්. එච්. වික්‍රමාරච්චි එස්. වල්පලගේ එස්. එම්. එගොඩගේ	Development of a Competitive Thermoplastic Vulcanizate Roofing Sheet from Natural Rubber and High-Density Polyethylene	Moratuwa Engineering Research Conference (MERCon 2021)
ඩබ්. වී. ඩබ්. එච්. වික්‍රමාරච්චි එස්. වල්පලගේ එස්. එම්. එගොඩගේ	Investigation of Optimum Dicymul Peroxide Loading for Thermoplastic Vulcanizate From Natural Rubber/High Density Polyethylene for Roofing Application	8th ITUM Research Symposium (ITUMRS 2021)
සුදර්ශන පෙරේරා ශාන්ත එගොඩගේ එස්. වල්පලගේ	Implementation of a novel processing method to reduce clay aggregation of natural rubber-clay nanocomposite to improve mechanical properties	ITUMRS 2021 date of accessioned- 29th Sept 2021

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / ජර්නලය / පොත් / ප්‍රවේශ වූ දිනය
එච්. එම්. මධුෂිකා ටී. යූ. ආරියදාස එස්. එච්. පී. ගුණවර්ධන	Biodegradation of reactive yellow EXF dye: optimization of physiochemical parameters and analysis of degradation products	International journal of Environmental Science and Technology · March 2021
කේ. එම්. ඩබ්. අබේකෝන් එච්. කේ. ජී. පුංචිහේවා එල්. ඩී. ජී. එෆ්. නානායක්කාර	Physical capability needs in apparel sewing room: WARM mapping framework for people with physical disabilities	World Disability and Rehabilitation Conference (WDRC) 2021 11 11 2021 – 12 11 2021
ශ්‍රීමාලා පෙරේරා	Facilitating student learning with meaningful priming	SLAIHEE Higher Education Conference, 2021 30th July 2021
වී. ජී. පී. පබසරා	Adaptation of Jigsaw technique to virtual classroom at COVID-19 onset and its effect on student learning experience	17th Annual SLAIHEE Conference on Higher Education in Sri Lanka; 30th July 2021

09. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
පොලිමර් සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය	නිපුණතා සංවර්ධන වැඩසටහන (සැසිය **01)** (Introduction to soft skills) **(HPK** උදාන මහතා**)**	2021.05.20	තුන් වන වසර සිසුන් (2020/2021)	
	නිපුණතා සංවර්ධන වැඩසටහන (සැසිය **02)**)(Young leaders beyond 2021 & Let difficulties know that you are difficult) **(**චරිත් මල්ලිකාරච්චි මහතා, ඩී.පී. ලියනගේ මහතා**)**	27.05.2021	තුන් වන වසර සිසුන් (2020/2021)	
	නිපුණතා සංවර්ධන වැඩසටහන (සැසිය **03)(**ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ සාකච්ඡාව**) II** අධ්‍යයන වාරය ඉංජිනේරු (මයා) (එරංග දිල්ෂාන්, ඉංජිනේරු (මයා) ප්‍රසාද් ද සිල්වා)	10.06.2021	තුන් වන වසර සිසුන් (2020/2021)	
	නිපුණතා සංවර්ධන වැඩසටහන (සැසිය **04)**)(The key to success & Your Mindset at work) **(**ලියෝනි වාස් මහත්මිය, චමිතා කුමාරසිංහ මහත්මිය**)**	09.07.2021	තුන් වන වසර සිසුන් (2020/2021)	
	ඵලදායී ලෙස යෝග්‍යතා විස්තරයක් ලිවීම සහ සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීම **(D.R.D** කුමාර මහතා, **HPK** උදාන මහතා**)**	21.06.2021	හතර වන වසර සිසුන් (2019/2020)	
	පොලිමර් තාක්ෂණ සිසුන් සඳහා ආදර්ශ සම්මුඛ පරීක්ෂණ වැඩසටහන.	23.08.2021	හතර වන වසර සිසුන් (2019/2020)	

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
පොලිමර් සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය	රසායනික ඉංජිනේරු සිසුන් සඳහා ආදර්ශ සම්මුඛ පරීක්ෂණ වැඩසටහන.	06.09.2021	හතර වන වසර සිසුන් (2019/2020)	
	නිෂ්පාදන විශිෂ්ටත්වය	05.12.2021		
	දැනුවත් කිරීමේ සැසිය - ISO 17025 රසායනාගාර තත්ත්ව කළමනාකරණය	29.12.2021	සියලුම කාර්ය මණ්ඩලය	
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය	රට තුළ තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රවර්ධනය කිරීම	06/06/2021	80	මාර්ගගත ක්‍රමයට සිසුන් සඳහා පවත්වන ලදී
	ත්‍රිමාණ නිර්මාණයේ සහ අතථ්‍ය අනුකරණයේ වටිනාකම අවබෝධ කර ගැනීම	10/06/2021	75	මාර්ගගත ක්‍රමයට සිසුන් සඳහා පවත්වන ලදී
	සේවකයාගේ කුසලතා හැකියාව සහ කර්මාන්ත අත්දැකීම් බෙදාගැනීම	03/07/2021	26	මාර්ගගත ක්‍රමයට සිසුන් සඳහා පවත්වන ලදී
සමුද්‍ර අධ්‍යයනය	Desire for Sea' ජී.ජී.ජයරත්න මහතා	2021/06/17	45	දෙවන වසර සිසුන් සඳහා
	'කැඩෙට් නිලධාරියෙකු ලෙස ඔබම හැඩගස්වා ගන්නේ කෙසේද? (කපිතාන් නන්දික පීරිස්)	2021/06/19	47	
	'ඔබ අභියෝග භාර ගැනීමට සූදානම්ද' (ප්‍රධාන ඉංජිනේරු ඩබ්ලිව්.ඒ.ඩී.ඩබ්ලිව්.එල් වීරසිංහ මහතා)	2021/06/24	45	
	'Why you Need Preparedness' (කපිතාන් ගාමිණී විල්සන්)	2021/06/26	47	දෙවන වසර සිසුන් සඳහා
	නායකත්වය සහ අභියෝග (කපිතාන් ලක්ෂි වසන්ත)	2021/06/27	46	

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් තාක්ෂණය	“නූල් ආවරණ සහ වයනය නව ක්‍රමය සහ කර්මාන්ත අත්දැකීම්” පිළිබඳ වැඩමුළුව ජ්‍යේෂ්ඨ විධායක **C.** විජේසිංහ මහතා **Stretchline (PVT) Ltd,** බියගම නිෂ්පාදන සංවර්ධනය සහ නවෝත්පාදනය	**2021**/06/**10**	සිසුන් සහ රෙදිපිළි හා ඇඳුම් තාක්ෂණ අංශයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලය	
	“නූල් වල ප්‍රමිතියේ සිට රෙදි ප්‍රමිතියට: නූල්වලින් රෙදි නිපදවීම් කර්මාන්තයේ පුහුණුව” සම්බන්ධ වැඩමුළුවක් අවිස්සාවේල්ල ටීජේ ලංකා (පුද්ගලික) සමාගමේ ගෙතුම් කළමනාකරු හිරන්ත බණ්ඩාර මහතා	**2021**/06/**15**	සිසුන් සහ රෙදිපිළි හා ඇඳුම් තාක්ෂණ අංශයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලය	
	"සංකල්පයෙන් වෙළඳපොළට" ජ්‍යෙෂ්ඨ කළමනාකාර - පාරිභෝගික නායක **PVH N.** බණ්ඩාර මෙනවිය සහ **Merchandising Brandix Essentials** කළමනාකරු **D.** වැවගෙදර මෙනවිය	**2021**/06/**17**	සිසුන් සහ රෙදිපිළි හා ඇඳුම් තාක්ෂණ අංශයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලය	
	“පුහුණුව පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය” සජීත් දිසානායක මහතා, දමිත ජයසුන්දර මහතා, ප්‍රින්ස්ලි වීරකෝන් මහතා, රොෂාන් ප්‍රියදර්ශන මහතා, කාලිංග මධුශංක මහතා සහ චලන ගල්කිස්ස මහතා ඇතුළු **NDT** ටෙක්ස්ටයිල් ආදි සිසුන් කණ්ඩායම	**2021/09/21**	රෙදිපිළි හා ඇඳුම් තාක්ෂණ අංශයේ **IV** වන අධ්‍යයන වාරයේ සිසුන්	

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් තාක්ෂණය	**'Lean manufacturing and Dancing modules'** **MAS Intimates හි Thurulie හි නිෂ්පාදන සහය ප්‍රධානී දර්ශන තෙන්නකෝන් මහතා**	16/10/2021	**රෙදිපිළි හා ඇඳුම් තාක්ෂණ අංශයේ IV වන අධ්‍යයන වාරයේ සිසුන්**	
	III අධ්‍යයන වාරයේ ප්‍රාදේශීය ශිෂ්‍යයින් විසින් චිත්‍ර ඇඳීම, ගායනය, කවිය සහ වාදනය සඳහා සිසුන්ගේ නිර්මාණාත්මක හැකියාවන් ප්‍රදර්ශනය කරමින් විශිෂ්ට කුසලතා සංදර්ශනයක් සංවිධානය කරන ලදී.	**19.11.2021**	රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් තාක්ෂණික අංශයේ සිසුන් ,අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය	
	MAS Fabrics Metrix, MAS Fabric Park, කුරුණෑගල පාර, තුල්හිරිය වෙත කර්මාන්තශාලා සංචාරය.	**15.12.2021**	අධ්‍යයන කාර්ය මණ්ඩලය **(ආචාර්ය කේ.එම්. ඩබ්ලිව්. අබේකෝන් මිය සහ වී.ජී.පී. පබසරා මිය.**	
	An official discussion on training with a team of Hela Clothing. too attended.	17.12.2021	**ආචාර්ය කේ.එම්.ඩබ්ලිව්.අබේකෝන් ආචාර්ය ඩබ්ලිව්.පී.එස්.කේ පෙරේරා වී.ජී.පී පබසර මිය, ආචාර්ය එම්.සී.ඩබ්ලිව්.සෝමරත්න, කමල්නාත් ජීනදාස, ආචාර්ය ජී.කේ.ජයතුංග.**	
	Webinar on Ethics in Research	22.07. 2021	Open for Researchers	**IESL, SLAAS සහ ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලදී වීජීපී පබසරා මහත්මිය සහභාගී විය**

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
පෙරදිගු සහ ඇඳුම් පැළඳුම් තාක්ෂණය	ඉහළ බලපෑමක් ඇති සඟරා සඳහා ලිපි ලිවීම	25.05. 2021	Open for Researchers	**IESL, SLAAS** සහ ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලදී වීජීපී පබඳරා මහත්මිය සහභාගී විය
	පුළුල් සාහිත්‍ය සමාලෝචනයක් පවත්වන්නේ කෙසේද?	14.03 2021	වෘත්තිකයන් සහ පර්යේෂකයන්	**IESL** විසින් සංවිධානය කරන ලදි **VGP** පබඳරා මහත්මිය සහභාගී විය
	"දේශගුණික විපර්යාස සහ තිරසාර සංවර්ධනය සඳහා බලශක්ති කාර්යක්ෂමතාව" පිළිබඳ දැනුම බෙදාගැනීමේ වැඩමුළුව	**2021 ජුනි 12 - 17**	උපපරිපාලක - මහාචාර්ය රංගික හල්වතුර	ආචාර්ය කේ.එම්.ඩබ්ලිව්.අබේකෝන් මහත්මිය සහභාගී විය
	ලෝක ආබාධිත හා පුනරුත්ථාපන සමුළුව **(WDRC) 2021**	**2021 11 සිට 12 දක්වා**	ආචාර්ය කේ.එම්.ඩබ්ලිව්.අබේකෝන් මහත්මිය	සැසියේ සභාපති සහ විද්‍යාත්මක සමාලෝචන කමිටු සාමාජිකයෙක්

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
විෂයානන්තර අධ්‍යයන අංශය	"සම්පූර්ණ තත්ත්ව කළමනාකරණය" (යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණ ප්‍රධානී/ අංශයේ මලින් ගුණසේකර මහතා)	2021 නොවැම්බර් 8 වැනි දින මාර්ගගතව පැවැත්විණි	තත්ත්ව සහතික ඒකක සාමාජිකයන්	තත්ත්ව සහතික කිරීමේ ඒකකය විසින් සංවිධානය කරන ලදී (සභාපතිවරයෙකු ලෙස)
	"තත්ත්ව කළමනාකරණ පද්ධතිය". (සමුද්‍රීය අධ්‍යයන අංශයේ කථිකාචාර්ය දිලීෂා විජේරත්න මහත්මිය			
	සිසුන් 800 ක් සඳහා එකවර මාර්ගගත දේශන පැවැත්වීම පිළිබඳ වැඩමුළුව	2021 නොවැම්බර් 17	අධ්‍යයන කාර්ය මණ්ඩලය	අධ්‍යයන වාරයේ සම්බන්ධීකාරකවරුන් විසින් සංවිධානය කරන ලදී (සෙමෙස්ටර් III සම්බන්ධීකාරක ලෙස)

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
තොරතුරු තාක්ෂණ අංශය	**ML සහ AI ක්‍රියාවලිය සහ ආයෝජන පර්යේෂණ ක්ෂේත්‍රයේ එහි භාවිතය පිළිබඳ දළ විශ්ලේෂණයක්. Cloud** තාක්ෂණයන්, මෘදුකාංග සංවර්ධනය සම්බන්ධයෙන් හොඳම භාවිතයන්	**2021** පෙබරවාරි **5**	**2018/2019** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	
	Docker - Hands on Training Session	**2021** මාර්තු **4**	**2018/2019** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	
	අයදුම්පත්‍ර සකස් කිරීම, පුද්ගලික හැඩගැසීම් සහ සම්මුඛ පරීක්ෂණ සකස් කිරීම පිළිබඳ වැඩමුළුව	**2021** අප්‍රේල් **5**	**2018/2019** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	
	වෘත්තීය සංවර්ධන වැඩමුළුව	**2021** මාර්තු **23**	**2019/2020** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	
	හඳුන්වාදීමේ සැසිය	**6** ජුනි **2021**	**2019/2020** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	
	‘‘ඔබේ කාර්යබහුල දවසේ සතුටින් සිටින්න’’	**2021** ජුනි **10**	**2019/2020** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	
	‘‘තොරතුරු තාක්ෂණයේ වෘත්තීය අවස්ථා’’	**2021** ජුනි **15**	**2019/2020** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	
	"අර්බුදයක් හරහා ගමන් කිරීම: COVID-19 වසංගතයේ අභියෝග සහ තාක්ෂණික අධ්‍යාපනයේ අනාගතය හැඩගස්වා ගන්නේ කෙසේද"	**2021** ජුනි **25**	**2019/2020** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	
	‘’ Advanced Public Speaking’’	**2021** ජුනි **28**	**2019/2020** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
තොරතුරු තාක්ෂණ අංශය	'ඔබේ ජීවිතය සාර්ථක වන්නේ කෙසේද'	**2021 ජූලි 14**	**2019/2020** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	
	''Agile Protect management with SURUM''	2021 නොවැම්බර් 16	**2019/2020** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	
	"GIT සහ GITHUB සමඟ අනුවාද පාලනය"	**2021 සැප්තැම්බර් 7**	**2019/2020** කාණ්ඩයේ තොරතුරු තාක්ෂණ සිසුන්	
	මාර්ගගත ඉගැන්වීම් සඳහා පවතින මෙවලම් පිළිබඳ වැඩමුළුව	**2021 ජනවාරි 21**	සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලය	
	වීඩියෝ සංස්කරණ මෘදුකාංග (වැඩමුළුව)	**2021 ජනවාරි 21**	අධ්‍යයන කාර්ය මණ්ඩලය	
	මාර්ගගත ඉගැන්වීම් සඳහා අවශ්‍ය මෙවලම් පිලිබඳ වැඩමුළුව	**2021 අප්‍රේල් 22**	අධ්‍යයන කාර්ය මණ්ඩලය	
	සහභාගිවන්නන් **300**කට වැඩි සංඛ්‍යාවක් සඳහා **zoom** හරහා මාර්ගගත දේශන පැවැත්වීම	**2021** නොවැම්බර් **11**	අධ්‍යයන කාර්ය මණ්ඩලය	
	2021 ITUM පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා තාක්ෂණික සහාය	**29-**සැප්තැම්බර්-**2021**	අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ බාහිර සහභාගිවන්නන්	
	දිශානති වැඩසටහන සඳහා තාක්ෂණික සහාය	**2021** ඔක්තෝබර් **25 - 29**	සිසුන් සහ කාර්ය මණ්ඩලය	

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
තොරතුරු තාක්ෂණ අංශය	මාර්ගගත විභාග පැවැත්වීම පිළිබඳ වැඩමුළුව	2021 ජුනි 14	කාර්ය මණ්ඩලය	
	මාර්ගගත විභාග පැවැත්වීම පිළිබඳ වැඩමුළුව	2021 ජුනි 15	සිසුන්	
	ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රසිද්ධියේ කතා කිරීම (තොරතුරු තාක්ෂණ අංශය විසින් සංවිධානය කරන ලද සහ ආරාධිත කථිකාචාර්ය ආචාර්ය අබ්දුල් නෝල්ස් විසින් මෙහෙයවනු ලැබේ)	2021 අප්‍රේල් 13 සිට 26	සිසුන්	

10. ශිෂ්‍ය ක්‍රියාකාරකම්

සම්මාන
ප්‍රධානෝත්සවය



කාර්ය මණ්ඩල වැඩමුළු



11. පුනරාවර්ථන වියදම් විස්තරය

විෂයය	2020 (රු)	2021 (රු)
අ) සේවක පාරිශ්‍රමික	329,498,875.00	363,871,923.00
ආ) ගුවන් වියදම්	27,923.00	56,306.00
ඇ) සැපයුම්	6,688,738.00	9,639,804.00
ඈ) නඩත්තු	7,482,974.00	17,202,277.00
ඉ) ගිවිසුම් හා සේවා	87,718,257.00	94,190,190.00
ඊ) වෙනත්	9,729,875.00	7,890,463.00
එකතුව	**441,146,642.00**	**492,850,963.00**

12. ප්‍රාග්ධන වියදම් විස්තරය

විෂයය	2020 (රු)	2021 (රු)
අ) ලී බඩු විද්‍යාගාරසහ කාර්යාල උපකරණ අත්පත්කර ගැනීම	220,072.00	4,784,341.00
ආ) යන්ත්‍ර සහ පිරියත අත්පත් කර ගැනීම	436,117.00	36,558.00
ඇ) ගොඩනැගිලි හා ව්‍යුහයන් අත්පත්කර ගැනීම		
ඈ) වෙනත්	2,889,981.00	451,820.00
එකතුව	**3,546,170.00**	**5,272,719.00**

13. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තරය (වියදම්)

